# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2297/58 – 2022 සැප්තැම්බර් 15 වැනි බ්‍රහස්පතින්දා – 2022.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2016/158.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2018.08.09 දිනැති හා අංක 2083/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.07.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 146 හි පදිංචි ජාතික සේවක සංගම (සේවකයින් 20 දෙනෙකු වෙනුවෙන්) සහ හම්බන්තොට, මහලේවාය හි පිහිටි ලංකා සෝල්ට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.01.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගොනු අංකය: IR/COM/03/2016/158.

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

ජාතික සේවක සංගමය,
අංක 416,
කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

පැමිණිලිකාර පාර්ශවය

*නඩු අංකය:* A/56/2018.

**එරෙහිව,**

ලංකා සෝල්ට් ලිමිටඩ්,
මහ ලේවාය,
හම්බන්තොට.

වගඋත්තරකාර පාර්ශවය

වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 10 වැනි දින දීය.

**බලතල පැවරීම**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 දරන පනත්වලින් සංශෝධිත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත පවරා ඇත.

**උද්ගතව පවත්නා කාර්මික ආරවුලේ ස්වභාවය**

ලංකා සෝල්ට් ලිමිටඩ් හි සේවය කරන පහත නම් සඳහන් සේවකයන් 20 දෙනාට වයස අවුරුදු 60 දක්වා සේවා දිගුව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමි සහනයන් කවරේද යන්න පිළිබඳව පරීක්‍ෂා කර බලා සුදුසු ප්‍රදානයක් කිරීම මෙම අධිකරණයේ කාර්යභාරය වී තිබේ.

**සේවකයන්ගේ නම්**

01. ඩබ්. ජී. සුතසෝම
02. එච්. සුනිල්
03. සිසිර නානායක්කාර
04. ඒ. ජී. ධර්මසිරි
05. කේ. සිසිල් කුමාරි කුලතුංග
06. ජී. එම්. මුනිදාස
07. ඩබ්. ජී. ඩයස්
08. වී. රාජේෂ්වරී
09. ආර්. ඒ. ජී. ධර්මසිරි
10. ඊ. ගුණරත්න
11. හේවා කංකානම්ගේ දයාරත්න
12. ඒ. ප්‍රේමදාස
13. අයි. කේ. සෝමපාල
14. වී. ජී. ලීලානන්ද
15. ඕ. එච්. සිරිපාල
16. අබේසිංහ මද්දුමපටබැඳිගේ ගාමිණී
17. අජිත් නානායක්කාර
18. ඩබ්. ජී. නිමල්
19. ටී. ඩබ්. කේ. චින්තා
20. එම්. ඒ. සරත්

**පාර්ශවයන්ගේ කරුණු දැක්වීම**

ඉහත සඳහන් කාර්මික ආරාවුල සම්බන්ධයෙන් වූ නඩුව විභාගයට ගැනීමට ප්‍රථමයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන වගන්තිය යටතේ 1959 මාර්තු මස 02 වැනි දිනැති අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික

ආරාවුල් පනත යටතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගය පරිදි මෙකී ආරාවුලට හේතු වූ කරුණු කාරණා සම්බන්ධයෙන් පාර්ශවයන් වෙතින් ප්‍රකාශ ඉල්ලා සිටි අතර එහිදී පළමු පාර්ශවය මෙන්ම දෙවන පාර්ශවයද ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබිණි. එම කරුණු දැක්වීම තුළින් ගෙනහැර දක්වන කරුණු ඉතා සරලව හා සාරාංශ වශයෙන් පහත පරිදි දැක්විය හැකියි.

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

- තවදුරටත් සේවය කළහැකි ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් සිටින පළපුරුදු සේවකයන් වන බව.
- රටතුළ පවත්නා හා සම්මතයක් ලෙස පිළිගෙන ඇති වයස අවුරුදු 60 දක්වා සේවය ලබා දීමට ඔවුන්ට තිබූ අයිතිය අහිමි කර තිබෙන බව.
- වර්ෂ 1935 තරම් ඈත අතීතයේ දී ලුණු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භව පසුව දෙපාර්තමේන්තුවක් බවටත් ඉන් ඉක්බිතිව රාජ්‍ය සංස්ථාවක් බවටත් පත්ව දැනට රාජ්‍ය සමාගමක් බවට පත්ව තිබෙන ආයතනයක් බව.
- මෙය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍යමය දායකත්වය දරන ආයතනයක් බව.
- එම නිසාම සේවා යෝජකයකුගේ වගකීම්වලට සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය යටත් වන බව.
- එහි සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන්නේ මධ්‍යම රජයෙන් බව.
- ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේද සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ රජය විසින් බව.
- එම නිසා එම ආයතනය රජයේ ප්‍රතිපත්ති හා තීන්දු තීරණ අනුගමනය කිරීමට බැඳී සිටින බව හා ඒවා අභිබවා කටයුතු නොකළ යුතු බව.
- වරෂ 1995ට පෙර සේවයට බැඳුන අයට වයස අවුරුදු 60 දක්වා ද ඉන්පසු සේවයට බැඳුන අයට වයස අවුරුදු 55 දක්වා ද සේවය කිරීමට සැලසීම තුළින් එක් පිරිසකට වෙනස් කොට සැලකීමක් පවත්නා බව.
- පත්වීම් ලිපි වල විශ්‍රාම ගන්වන වයස අවුරුදු 55 බව සඳහන්ව තිබුන ද රාජ්‍ය ප්‍රතිපත්තිය මත එය අවුරුදු 60 දක්වා දීර්ඝ වීම පිළිගත යුතු බව.
- එහෙත් අධ්‍යක්ෂ මණ්ඩලය සේවකයන්ට ඒ සඳහා අවස්ථාව ලබා නොදෙන බව.
- අංක 01/2013 දරන හා 2013.01.15 දිනැති චක්‍රලේඛය පරිදි සේවකයන්ට වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට දී ඇති බලය අහිමි කිරීම ඔවුන්ගේ මූලික අයිතියක් අහිමි කිරීමක් වන බව
- 1975 වර්ෂයේ නිකුත් වූ අංක 263 දරන චක්‍රලේඛයට අනුව සේවකයන්ට සේවා දිගු කිරීම් ලබා දී නොමැති බව.
- සමහර සේවකයන්ට පමණක් වයස අවුරුදු 55 න් ඔබ්බට කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සේවය කිරීමට අවස්ථාව ලබාදී තිබෙන බව.
- වර්ෂ 2016 රජයේ අයවැය ලේඛනය අනුව රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම් නාමලේඛනයට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය ද ඇතුළත්ව ඇති බව.

මෙහි නම් සඳහන් සේවකයන්ට වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසත්, වයස අවුරුදු 55න් පසු සේවය කිරීමට අවස්ථාව ලබා නොදුන් සේවකයන්ට අවුරුදු 60 දක්වා දීමනාද සහිතව හිඟ මුදල් ලබා දීමටත් ඊට අමතර වශයෙන් ලබාදිය හැකි වෙනත් සහන වේ නම් ඒවාද ලබා දෙන ලෙසත් අවසාන වශයෙන් ඉල්ලීම් කර තිබේ.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

- සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීම වයස අවුරුදු 55 බව.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම තීරණයේ වෙනසක් සිදු කර නොමැති බව.
- මෙම ආයතනය ලුණු දෙපාර්තමේන්තුව වශයෙන් හා ලුණු සංස්ථාව වශයෙන් පැවතී ඇති බව.
- 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වර්ෂ 1990 දෙසැම්බර් මස 21 දින සිට ලංකා සොල්ට් ලිමිටඩ් යනුවෙන් සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව හා එහි සියලු කොටස් මහා භාණ්ඩාගාරය සතු වූ බව.
- වර්ෂ 1997 දී භාණ්ඩාගාරය සතු කොටස් වලින් 90%ක් සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය මිලදී ගත් බව හා ඉතිරිය (10%) සමාගමේ සේවකයන් අතර බෙදන ලද බව.
- 1997න් පසුව මහා භාණ්ඩාගාරය ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමේ කිසිදු කටයුත්තකට සෘජුව මැදිහත් නොවූ බව.
- පැමිණිල්ල දන්වා සිටින පරිදි ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට ගැනෙන සමාගමක් නොවන බව.
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය දායකත්වය ලබන ආයතනයක් ද නොවන බව.
- ලංකා සෝල්ට් සමාගම කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් යටතේ පවත්වාගෙන යන ව්‍යාපාරයක් නොවන බව හා ලුණු විකිණීමෙන් ලබන ආදායමෙන් සේවක වැටුප් ගෙවන, එමෙන්ම පරිපාලනය වන සමාගමක් බව.
- මෙම සමාගම සතු මහ ලේවාය කොහොලන්කල, බුන්දල හා පලටුපාන යන ලේවායන් වෙනුවෙන් රජයට ගෙවිය යුතු බදු මුදල් ආදිය ගෙවන බව.

- මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය විසින් යොමු කරනු ලබන නාමලේඛනයක් පදනම් කරගෙන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ ප්‍රතිපාදන අනුව සිදු කරන බව.
- රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධයෙන් වූ අංක PED/01/2013 දරන හා 2013.01.15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් මෙම සමාගමේ සේවකයන්ට අදාළ වීම පිළිබඳව එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතින් විමසීමක් කරන ලද බව හා ඒ සම්බන්ධයෙන් සේවා නියුක්තිභාර අරමුදල් මණ්ඩලයේ අනුමැතිය හා අදාළ අණපනත්වල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සුදුසු බවට උපදෙස් ලබා දුන් බව.
- සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලයේ සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60ක් වන බව.
- මෙම ආයතනයේ සේවය සඳහා වර්ෂ 1995.12.15 දිනට පෙර සේවයට බැඳුන සේවකයන්ට වයස අවුරුදු 60 දක්වා සේවය කළහැකිව පවතින බවට චක්‍රලේඛය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබෙන බව.
- වර්ෂ 1995.12.15 ට පසු සේවයට බැඳුන අයව වයස අවුරුදු 55 දී විශ්‍රාම ගන්වන බව හා අවශ්‍යතාවය මත විශ්‍රාම ගැන්වීමෙන් පසු වැඩ පැවරුමක් මත සේවය ලබා දෙන බව.
- මෙම සේවකයන් වයස අවුරුදු 55 දී විශ්‍රාම යා යුතු අතර ඔවුන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත වැඩ පැවරුම් ලබා දීමට කටයුතු කර තිබෙන බව.
- ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට බලතල හිමි වී ඇත්තේ සමාගමේ ව්‍යවස්ථාව මගින් බව.
- වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම යායුතු සේවකයන් කිහිප දෙනෙකු සඳහා ද සේවා අවශ්‍යතාවය මත සේවා දීර්ඝ කිරීම් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබෙන බව.
- රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අදාළ කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරනතාක් එවැනි කිසිදු චක්‍රලේඛනයක් සමාගමට අදාළ ලෙස නොසලකන බව.

ඉහත සඳහන් ආකාරයෙන් දෙපාර්ශවය විසින්ම උද්ගත ආරවුලට අදාළව කරුණු දක්වීමෙන් පසු මෙම ආරවුල සම්බන්ධයෙන් පාර්ශවයන් අතර කිසියම් සාධාරණ වූ සමථයකට පත් කර ගැනීමේ හැකියාවක් පවතී ද යන්න සඳහා සලකා බැලීමට ඒ සඳහා ද අවස්ථාව ලබා දීමට අවශ්‍ය විධිවිධාන සලසා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකාර පාර්ශවය විසින් සමථ යෝජනාවක් ලිඛිතව ඉදිරිපත් කර තිබිණි. එහි යෝජනා වී තිබුනේ අදාළ සේවකයන් විශ්‍රාම ගන්වන ලද වර්ෂයන්ට අනුකූල වන පරිදි එනම් 2016 වර්ෂයේ දී විශ්‍රාම ගන්වන ලද අය වෙනුවෙන් 75% ක හිඟ වැටුප සහිතව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට නැවත අවස්ථාව ලබා දීමත් 2017 වර්ෂයේදී විශ්‍රාම ගන්වන අය වෙනුවෙන් 60%ක හිඟ වැටුප් සහිතව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව ලබා දීමත් 2018 වර්ෂයේදී විශ්‍රාම ගන්වන අය වෙනුවෙන් 50% හිඟ වැටුප් සහිතව වයස අවුරුදු 60 දක්වා නැවත සේවය කිරීමට අවස්ථාව ලබා දීමත් ඉතිරි අය සඳහා වයස අවුරුදු 60 වන තෙක් සේවය කිරීමට හිමිකම ලබා දීමත් සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසය. පැමිණිලිකාර පාර්ශවයේ මෙම සමථ යෝජනාව වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීය.

එම නිසා මෙම නඩුව විභාගයට ගෙන ඉදිරිපත් වන සාක්ෂි අනුව පදනම්ව සාධාරණවූත්, යුක්ති සහගතවූත් ප්‍රදානයක් ලබා දීමට තීරණය කරමින් නඩු විභාගය ආරම්භ කිරීම සඳහා පැමිණිලිකාර පාර්ශවයට අවස්ථාව ලබා දෙන ලදී.

<u>විසඳිය යුතු ප්‍රශ්න</u>

I. ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමේ සේවයේ නිරතව සිටි හා නම් ඇතුළත් මෙහි දැක්වෙන සේවක සේවිකාවන්ට අංක PED/01/2013 දරන හා 2013.01.15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අදාළ වන්නේද?

II. අදාල වන්නේ නම් මේ අවස්ථාවේ ඔවුන් සම්බන්ධයෙන් ලබා දිය යුතු සහන කවරේද?

III. එසේ නැතහොත් මෙම චක්‍රලේඛයෙන් බැහැරව කටයුතු කිරීමට ලංකා සෝල්ට් ලිමිටඩ් හි පාලනාධිකාරියට බලතල පැවරී තිබේද?

IV. ලංකා සෝල්ට් සමාගමේ පාලනාධිකාරය විසින් මෙම සේවක සේවිකාවන් සඳහා දැනටමත් කිසියම් හෝ සහනයක් ලබා දී තිබේ නම් ඒවා ආවරණය කරගත යුතු ආකාරය කුමක්ද?

ඉහත දැක්වෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමේ අරමුණ පෙරදැරි කර ගෙන මෙම නඩුව විභාගයට ගැනීම සඳහා තීරණය කරන ලද අතර එහිදී අවසාන වශයෙන් පාර්ශව වෙතින් විමසා සිටියේ කිසියම් සමථයක් තිබේ නම් එය ලිඛිතව ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසයි. ඒ අනුව පැමිණිලිකාර පාර්ශවය විසින් 2018.12.06 දිනැතිව සමථයක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ ද එම යෝජනා වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මේ නිසා නඩු විභාගය ආරම්භ කරමින් පළමුවෙන් සාක්ෂි මෙහෙයවීම සඳහා පැමිණිලිකාර පාර්ශවයට අවස්ථාව ලබා දීමට තීරණය කළෙමි.

පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබා දුන් පළමු සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ තමන්, වගඋත්තරකාර ආයතනය ශ්‍රී ලංකා ජාතික ලුනු සංස්ථාව නමින් ක්‍රියාත්මක අවස්ථාවේදී සේවයට බැඳුණ බවයි. එහිදී තමන් තනතුරු කිහිපයකටම උසස්වීම් ලද බවත්, ඒ සඳහා ලබා දෙන ලද කිසිදු පත්වීම් ලිපියක විශ්‍රාම ගතයුතු වයස් සීමාව සඳහන්ව නොතිබුණ බවත් කියා සිටියේය. ඉන්පසු වගඋත්තරකාර ආයතනය ලංකා සෝල්ට් ලිමිටඩ් වශයෙන් හඳුන්වා දෙන ලද බවත් එහිදීද තමන් උසස්වීම් ලද බවත් A 1 සිට A 6 දක්වා සලකුණු කරන ලද එකම පත්වීම් ලිපියකවත් තමන් විශ්‍රාම ගතයුතු වයස සඳහන් නොවූ බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේය. එහෙත් වර්ෂ 2015 ජූලි 23 දිනැති සහකාර නිෂ්පාදන කළමණාකරු විධායක V1 ශ්‍රේණියට පත්කරන ලද හා A 7 වශයෙන් සලකුණු කරන ලද පත්වීම් ලිපියේ විශ්‍රාම යා යුතු වයස අවුරුදු 55 වශයෙන් සඳහන්ව තිබූ බව සාක්ෂිකරු පිළිගත්තේය. 2016 මැයි මසදී තමන් නිෂ්පාදන කළමණාකරු විධායක ශ්‍රේණියට පත් කරන ලද බවත් ඒ සඳහා ලද ලිපිය A 8 වශයෙන් සලකුණු කරන ලද බවත් සාක්ෂිකරු ප්‍රකාශ කළ අතර එම ලිපිය මගින්ද විශ්‍රාම ගතයුතු වයස අවුරුදු 55 බව සඳහන්ව තිබූ බව සාක්ෂිකරු පිළිගත්තේය. සාක්ෂිකරු ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් තවදුරටත් ප්‍රකාශ කර සිටියේ තමා වයස අවුරුදු 55 දී තම සේවය දිගු කරන ලෙස ඉල්ලා සිටි බවයි. එසේම තමන්ට වයස 60 දක්වා සේවය කිරීමට හැකි බවට විශ්වාශයක් තමා තුළ තිබූ බව හෙතෙම ප්‍රකාශ කර සිටියේය. වගඋත්තරකාර ආයතනය තමන්ට හා තවත් අයට වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව ලබා නොදුන් බවද මේ සම්බන්ධයෙන් තම වෘත්තීය සමිතිය මැදිහත්ව කටයුතු කළ බවද සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. ඒ කෙසේ වෙතත් තමාව වයස අවුරුදු 55 දී විශ්‍රාම ගන්වන ලද බවද විශ්‍රාම ගැනීමෙන් පසු මාස 15 ක සේවා දිගු ලබා දී තිබෙන බවද ඔහු ප්‍රකාශ කර සිටියේය. ඒ අනුව තමන්ට අවුරුදු 03 මාස 09ක කාලයක් සේවය කිරීම අහිමි කර තිබෙන බවද සාක්ෂිකරු සක්ෂි දෙමින් ප්‍රකාශ කළේය.

වගඋත්තරකාර පාර්ශ්වයේ හරස් ප්‍රශ්නවලට සාක්ෂිකරු පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටියේ තමන් විශ්‍රාම ගතයුතු වයස අවුරුදු 55 බව පසුව දැන ගත් බවයි. තමන්ට වයස සම්පූර්ණ වීමේදි සේවය කිරීම සඳහා අවස්ථාව ඉල්ලා සිටි බවද ඔහු ප්‍රකාශ කරන ලදී. එහිදී වගඋත්තරකාර පාර්ශ්වය හබ කර සිටියේ සාක්ෂිකරු සේවා දිගු ඉල්ලා සිටියා විනා වයස 60 දක්වා සේවය කිරීමට ඉල්ලීමක් කර නොමති බවටය.

පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් තමන් සාක්ෂිකරුවෙකු ඉදිරිපත් කරන ලද අතර ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ 2013 වර්ෂයේදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් චක්‍රලේඛ අංක 01/2013 නිකුත් කර තිබෙන බවත් ඒ අනුව ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට හැකියාවක් පවතින බවයි. අදාළ චක්‍රලේඛය A 11 වශයෙන් සලකුණු කර තිබේ.

පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරු වශයෙන් වෘත්තීය සමිතියේ ශාඛා ලේකම්වරයා ප්‍රකාශ කර සිටියේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව සේවකයෙකුට ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව සැලසී තිබෙන බවයි. එය A 11වශයෙන් සලකුණු කර තිබේ.

ප්‍ර:- A 11 ලේඛනය අනුව ඉතා පැහැදිලිවම මොකක්ද කියලා තියෙන්නේ?

උ:- සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්යයෙන් වයස 60 දක්වා සේවයේ රැඳී සිටිය හැකිය.

මෙම චක්‍රලේඛය පරිශීලනය කිරීමේදී ඉහත ප්‍රකාශය සත්‍ය කරුණක් වුවද එහිදී අවධානය යොමුවිය යුතු ගැටලුකාරී අවස්ථාවන් හඳුනාගත යුතුව තිබේ. ඒවා අතර මෙම චක්‍රලේඛය ලංකා සෝල්ට් සමාගමට අදාළ වන්නක් ද යන්න ප්‍රධානතම කරුණක් වේ. එය අදාළ වීමට නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඊට හිමිවිය යුතු ද යන්නත්, සැලකිල්ලට ගත යුතු වූ තවත් කරුණකි.

මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දෙමින් පහත පරිදි ප්‍රකාශ කර තිබේ.

ප්‍ර:- R 12 හා R 13 දරන ලේඛන අනුව ඉල්ලුම්කාර සුතසෝම අවුරුදු 55 පසුව විශ්‍රාම ගොස් ඊට පසු ඔහුට වැඩ පැවරුම් ලබා දී ඒ මත කටයුතු කර තිබෙනවා නේද ?

උ:- ඔව්.

ඉහත ප්‍රකාශයන් වගඋත්තරකාර පාර්ශ්වය විසින් බිඳහෙලීමක් කර නැති අතර පැමිණිල්ලට අදාළ සේවකයන්ගෙන් වැඩි සංඛ්‍යාවක් සඳහා ඔවුන් විශ්‍රාම ගැන්වීමෙන් පසුව මේ ආකාරයෙන් පැවරුම් රාජකාරී ඔවුන් වෙත ලබා දී තිබේ ඒ අනුව පැහැදිලි වන්නේ ඔවුන් වයස අවුරුදු 55න් විශ්‍රාම ගැන්වුවද, තව දුරටත් සේවය කිරීමේ හැකියාව ඔවුන් සතුව තිබූ බවත් ඔවුන් විශ්‍රාම ගන්වන විට යෙදී සිටි රාජකාරි ඉදිරියටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ආයතනය සතුව පැවති බවත්ය. පැමිණිල්ලේ සාක්ෂිකරුගෙන් වගඋත්තරකාර පාර්ශ්වය හරස් ප්‍රශ්න විමසමින් පහත සඳහන් විමසීම් ද සිදුකර ඇත.

ප්‍රඃ- R 16 ලේඛනයේ සඳහන් වෙනවා නේද ? ආයතනවල සේවකයන්ගේ සේවය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සිදුකළ යුතුයි කියලා?

උඃ- ඔව්.

වගඋත්තරකාර පාර්ශ්වය R 16 ලෙස සලකුණු කර ඇත්තේ 2013.01.15 වැනි දිනැතිව නිකුත් කරන ලද අංක 01/2013 දරන චක්‍රලේඛයයි. එහි R 16 A දරන කොටස යටතේ දැක්වෙන්නේ ''**භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමනය කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති රාජ්‍ය බැංකු සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවන අතර එම ආයතනවල සේවකයන්ගේ සේවය දීර්ඝ කිරීම සම්බන්ධව තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සිදුකළ යුතුය**''. යනුවෙනි. එහෙත් වගඋත්තරකාර ආයතනය රාජ්‍ය බැංකුවක් නොවන බැවින් ඉහත ප්‍රකාශය වගඋත්තරකාර ආයතනයට අදාළ නොවන්නක් වන අතර එමඟින් කරුණු දෙකක් තහවුරු වන බවද කිව යුතුය.

එනම්,

1. භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමය කිරීමේ අවශ්‍යතාවයෙන් මෙම වගඋත්තරකාර ආයතනය නිදහස් කර නොමැති බව සහ,

2. වගඋත්තරකාර ආයතනයේ සේවයේ නියුතු සේවකයන්ගේ සේවය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය් අභිමතය අදාළ නොවන බවය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු දක්වන්නේ නම් වගඋත්තරකාර ආයතනයේ සේවයේ නියුතු සේවකයන්ට චක්‍රලේඛය පරිදි වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවකාශ සැලසී ඇති බැවින් වයස අවුරුදු 55න් ඔබ්බට සේවය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බවය.

මීළඟට අවධානයට යොමු කළ යුතු ප්‍රධානතම කරුණ වන්නේ ලංකා සෝල්ට් ලිමිටඩ් වගඋත්තරකාර ආයතනයේ සේවයේ නිරත සේවක, සේවිකාවන්ට අංක 01/2013 සහ 2013.01.15 වැනි දිනැති චක්‍රලේඛය අදාළ වන්නේ ද යන්න පිළිබඳව තවදුරටත් කරුණු සලකා බැලීමය. වර්ෂ 1935 දී ලුණු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භව පසුව දෙපාර්තමේන්තුවක් බවට පත්ව ඉක්බිතිව රාජ්‍ය සංස්ථාවක් වශයෙන් ද ක්‍රියාත්මක වූ මෙම ආයතනය වර්තමානයේ රාජ්‍ය සමාගමක් වශයෙන් කටයුතු කරන බව පැමිණිල්ලේ ස්ථාවරයයි. සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍යමය දායකත්වය දරන මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම මධ්‍යම රජයෙන් සිදු කරන බවද 2016 රාජ්‍ය අයවැය ලේඛනය අනුව රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම් නාම ලේඛනයට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය ඇතුළත් වී තිබෙන බවද එහි ගණුදෙනු සියල්ල විගණකාධිපතිවරයා විසින් විගණනයට ලක්කරන බවද පැමිණිල්ල විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ.

මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ තම ආයතනය 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1990.12.21 වැනි දින සිට ලංකා සෝල්ට් ලිමිටඩ් යනුවෙන් සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බවත් 1997 දී භාණ්ඩාගාරය සතු කොටස්වලින් 90% ක් සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය මිලදී ගත් බවත් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සේවා නියුක්ති භාර අරමුදල් මණ්ඩලය විසින් යොමුකරන නාම ලේඛනයක් පදනම් කරගෙන සිදු කරන බවත්ය. වර්ෂ 1995 දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර සේවයට බැඳුණ සේවකයන්ට වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි බවත් සේවා අවශ්‍යතාවය මත එවැනි සමහර සේවකයන්ට සේවා දීර්ඝකිරීමක්ද ලබා දෙන බවත් වර්ෂ 1995 දෙසැම්බර් මස 15 වැනි දිනට පසු සේවයට බැඳුණ අය වයස අවුරුදු 55 දී විශ්‍රාම ගන්වන බවත් ඔවුන්ට ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත වැඩ පැවරුම් ලබා දෙන බවත් ප්‍රකාශ කරන වගඋත්තරකාර පාර්ශ්වය එහිදී වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අදාළ කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන තාක් එවැනි කිසිදු චක්‍රලේඛයක් තම සමාගමට අදාළ වන්නක් ලෙස නොසලකන බවයි. වගඋත්තරකාර පාර්ශ්වයේ මෙම ප්‍රකාශයන්ගෙන් වැදගත් කරුණු කීපයක්ම හෙළිදරව් වන්නේය. එනම්, මෙම ආයතනය රාජ්‍ය ව්‍යාපාර සමාගම් බවට පත්කිරීමට යටත්ව පවතින සමාගමක් බව ද එනිසාම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ වගඋත්තරකාර ආයතනයට අදාළ වන බවද ඒ අනුව අංක 1/2013 හා 2013.01.15 වැනි දිනැති චක්‍රලේඛයද මෙම සමාගමට අදාළ වන බවද යනාදියයි. ඒ හැරුණු විට මෙහි සේවක සේවිකාවන් 1995.12.15 වන දිනට පෙර බැඳුණ හා 1995.12.15 වැනි දිනට පසු බැඳුණ වශයෙන් කොටස් දෙකකට බෙදා වෙනස්කර දැක්වීමක් සිදුකර සමහර වරප්‍රසාද ඉන් එක් කොටසකට අහිමි කරමින් දෙයාකාරයක පාලනයක් අනුගමනය කරන බවද පැහැදිලි වන අතර මෙම බෙදීමට වගඋත්තරකාර පාර්ශ්වය කිසිදු පැහැදිලි හේතුන්ද ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටියි. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු වන සුතසෝම යන අය මුලින්ම සේවයට බඳවාගෙන ඇත්තේ වර්ෂ 1981.07.15 වැනි දින බව සාක්ෂි අනුව පැහැදිලි වන අතර ඉන්පසුව ඔහු උසස්වීම් ලබා තිබේ. එහෙත් මෙම සේවකයාද වයස අවුරුදු 55 දී විශ්‍රාම ගන්වා තිබෙන බව ඉදිරිපත් සාක්ෂි අනුව තහවුරු වේ. මෙම තත්ත්වයන් වගඋත්තරකාර පාර්ශ්වය අභියෝගයට ලක්කර නැත.

වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පහත දැක්වෙන කරුණු හෙළිදරව් කර ඇත.

ප්‍රශ්:- 1/2013 චක්‍රලේඛය තමන්ගේ ආයතනය ක්‍රියාත්මක කරනවාද ?

උ:- ඔව්

ප්‍රශ්:- තමා පිළිගන්නවා එම රජයේ චක්‍රලේඛය තමන්ලා ක්‍රියාත්මක කළේ ප්‍රමාද වෙලා කියලා?

උ:- චක්‍රලේඛය අනුව කටයුතු කිරීම ප්‍රමාද වෙලා තියනවා. නමුත් චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සම්පූර්ණ අනුමැතිය ලබාදීමේ බලය පවතින්නේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩලයට ගනු ලැබූ තීරණ පරිදි තමයි මේ වන විට ක්‍රියාත්මක වෙන්නේ.

මින් පැහැදිලි වන්නේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ වගඋත්තරකාර ආයතනයට අදාළ වන බවත් ඒ අනුව 1/2013 දරන චක්‍රලේඛය වගඋත්තරකාර ආයතනය විසින් ප්‍රමාද වී හෝ ක්‍රියාත්මක කරන බවත්ය. මෙසේ ප්‍රමාදවීමට හේතු වී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය එය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දීමට ප්‍රමාදවීම හේතුකරගෙන බව ද පැහැදිලි වේ. නියෝජය සාමාන්‍යාධිකාරීවරයා තවදුරටත් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පහත පරිදි ප්‍රකාශ කර ඇත

ප්‍රශ්:- 2013 වර්ෂයේ ජනවාරි මාසයේ චක්‍රලේඛය එනම් R 16 චක්‍රලේඛය ආයතනය තුළ ක්‍රියාත්මක වනවාද?

උ:- 2020.01.30 වැනි දින සිට ක්‍රියාත්මක වෙනවා.

ඊට අමතරව සාක්ෂිකරු ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පහත සඳහන් පරිදිද කරුණු දක්වා තිබේ.

ප්‍රශ්:- ඊට පසු මෙම චක්‍රලේඛය එනවා 2013 වර්ෂයේ ජනවාරි මාසයේදී?

උ:- ඔව්

ප්‍රශ්:- ඒකෙදී කියන්නේ සේවකයන්ට අවුරුදු 60 දක්වා සේවය කරන්න අවස්ථාව දෙන්න කියලා නේද?

උ:- ඔව්

ප්‍රශ්:- මම අහන්නේ පෙර තිබුණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ද ක්‍රියාත්මක වෙන්න ඕන, 2013 වර්ෂයේ ජනවාරි මාසයේ නිකුත් කළ චක්‍රලේඛය ද ක්‍රියාත්මක වෙන්න ඕනේ කියලා?

උ:- 2013 චක්‍රලේඛය ක්‍රියාත්මක වෙන්න ඕන.

මේ පිළිබඳව සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න විමසීමේදී ''ඕනෑම චක්‍රලේඛයක් ක්‍රියාත්මක වීමේදී මා මීට පෙර ප්‍රකාශ කළ පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වෙනවා'' යනුවෙන් පිළිතුරු ලබා දී තිබේ. ඒ අනුව මේ දක්වා ඉදිරිපත් වූ සියලුම සාක්ෂිවලින් හෙළිදරව් වන්නේ වගඋත්තරකාර ආයතනයට අංක 1/2013 දරන 2013.01.15 වැනි දිනැති චක්‍රලේඛයද අදාළ වන බවත් එය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය කරන බවත්ය. එම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2020.01.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ලැබී තිබෙන බවද පැහැදිලිව පෙනී යයි. මෙම නඩුවට අදාළ පැමිණිලිකරුවන් 20 දෙනා සේවයෙන් විශ්‍රාමගන්වා ඇත්තේ 2015 වර්ෂයත් 2020 වර්ෂයත් අතරතුර කාලයේ වන අතර ඉන් වී. ජී. ලීලානන්ද යන සේවකයා පමණක් සිය කැමැත්ත මත විශ්‍රාම ගොස් තිබේ. අනෙක් සේවකයන් 19 දෙනාම වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගන්වනු ලැබූවන් වන අතර ඉන් සේවකයන් 17 දෙනෙකු විශ්‍රාම ගැන්වීමෙන් පසු ද ඔවුන්ට පැවරුම් රාජකාරි ලබාදෙමින් සේවයේ යොදවා තිබෙන බවක් පෙනී යයි. ඒ අනුව ඔවුන් සේවය කිරීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයකින් සිටි බවද ඔවුන්ගේ සේවය තවදුරටත් ආයතනයට අවශ්‍යව තිබූ බවද ඔවුන් විසින් දරන ලද තනතුරු අනුව එම රාජකාරි තවදුරටත් ආයතනය තුළ ක්‍රියාත්මකව පැවති බවද පිළිගැනීමට සිදුවේ.

එම නිසා මෙවැනි තත්ත්වයක් තුළ මෙම සේවකයන් වයස අවුරුදු 55 දී විශ්‍රාම ගැන්වීමට ප්‍රධාන වශයෙන් බලපෑ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණකි. අංක 1/2013 දරන හා 2013.01.15 වැනි දිනැති චක්‍රලේඛය සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්

වෙත හා රාජ්‍ය ව්‍යාපාර සභාපතිවරුන් වෙත යොමු වී තිබේ. ඒ අනුව වගඋත්තරකාර ආයතනයටද එය ලැබී තිබෙන අතර එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වෙත 2013.03.01 වන දිනැති ලිපියක් යොමුකර තිබේ. එය R 27 ලෙස සලකුණු කර ඇත. ඉන් පැහැදිලි වන්නේ සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධ අංක 1/2013 දරන චක්‍රලේඛය වගඋත්තරකාර ආයතනය වෙත 2013.03.01 වන දින හෝ ඊට පෙර ලැබී තිබුණ බවය. එම ලිපියට පිළිතුරු ලිපියක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013.05.30 දිනැතිව වගඋත්තරකාර ආයතනය වෙත යොමුකර තිබේ. එම ලිපිය R 28 ලෙස සලකුණු කර ඇත. වගඋත්තරකාර පාර්ශ්වය විසින් සාක්ෂි ලබාදීමේදී ලකුණු කරන ලද R 32 දරන ලේඛනයෙන් පැහැදිලි වන්නේ ලංකා සෝල්ට් ලිමිටඩ් විසින් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අදාළ කරගැනීම සම්බන්ධව නැවත උපදෙස් ලබා ගැනීම සඳහා 2019.10.07 වන දිනැති ලිපියක් යොමුකර තිබෙන බවයි. ඒ අදාළ චක්‍රලේඛය ලැබී වසර හයක කාලයක් ද ඉකුත් වූවාට පසුවය. එමෙන්ම එම චක්‍රලේඛය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරමින් අනුමැතිය ලැබීම සඳහා ඉදිරිපත් කර ඇත්තේ වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 25 වන දින දී බව R 33 දරන ලේඛනය අනුව පැහැදිලි වේ. ඒ අදාළ චක්‍රලේඛය වගඋත්තරකාර සමාගමට ලැබී වසර 07 ක් ඉක්ම ගිය පසුවය. ඒ අනුව 2020.01.30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයන් විශ්‍රාම ගැන්විය යුතු වයස අවුරුදු 60 දක්වා වන බවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ.

## ප්‍රදානය

එසේ නම් රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වයස යන ශීර්ෂය යටතේ ඉදිරිපත් වී ඇති අංක 1/2013 දරන හා 2013.01.15 වන දිනැති චක්‍රලේඛය අනුව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීම සඳහා පැමිණිලිකාර පාර්ශවයේ සේවකයන්ට අවස්ථාව නොලැබී ඇත්තේ ඔවුන් තවදුරටත් සේවය කිරීමේ අකමැත්ත නිසා හෝ ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම මත හෝ නොවන බවත් ඒ හැරුණු විට එකී චක්‍රලේඛයේ අදාළත්වය වගඋත්තරකාර සමාගමට නොමැතිවීමේ හේතුව මත හෝ නොවන බවත් ඉතා පැහැදිලිය. හුදෙක්ම වගඋත්තරකාර සමාගමේ අකාර්යක්ෂමතාවය හා නොසැලකිලිමත්භාවය මතම බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි හා සාධක මත තහවුරු වී තිබේ. එම නිසා පහත නම් සඳහන් සේවක සේවිකාවන්ට ඔවුන්ගේ වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඔවුන්ට නීත්‍යානුකූල අයිතියක් තිබූ බවටත් එම අයිතිවාසිකම වගඋත්තකාර සමාගමේ අකාර්යක්ෂමතාවය හා නොසැකිල්ල නිසා ඔවුන්ට අහිමි වී හෝ අහිමි වෙමින් හෝ තිබෙන බවටත් තීරණය කරමි. එම නිසා මේ වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ කරන හෝ එම වයස ඉක්මවා සිටින සේවකයන්ට ඔවුන් විශ්‍රාම යන අවස්ථාවේ ලද මූලික වැටුප පදනම් කර ගනිමින් ඔවුන්ට තම සේවය ලබාදීමට තිබූ අවස්ථාව අහිමි වූ වසර පහක කාලය සඳහා ඒ ඒ සේවක සේවිකාවන් ඉදිරියේ දක්වා ඇති පරිදි ඔවුන් වෙත වන්දි මුදලක් ගෙවීමට ද ඒ අතරතුර කාලයේ ඔවුන් පැවරුම් රාජකාරි මත යම් මුදලක් උපයාගෙන තිබේ නම් එසේ උපයාගත් මුදල එම වන්දි මුදලෙන් අඩුකර ගෙවීමට ද මින් නියෝග කරමි. මෙම වසර පහක කාලය තුළ ඔවුන් වාර්ෂික වැටුප් වැඩිවීම් උපයා නොගත් බවද සැලකිය යුතුය. එමෙන්ම පැමිණිලිකාර සේවකයන් අතර මේ වන විටත් වයස අවුරුදු 60 සම්පූර්ණ කර නොමැති සේවකයන් ඔවුන්ගේ විශ්‍රාම වයසට එළඹෙන තෙක් කැමැත්ත මත නැවත සේවයේ යෙදවීමටත් කිසියම් සේවකයෙක් එසේ නැවත සේවයේ යෙදීමට යම් ආකාරයකින් අකමැත්ත ප්‍රකාශ කරන්නේ නම් ඔහු හෝ ඇය වහාම ක්‍රියාත්මකවන පරිදි විශ්‍රාම ගැන්විය යුතු බවටත් මින් නියෝග කරන අතර අදාළ සේවකයන් වෙත ගෙවීම සඳහා ඔවුනොවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති වන්දි මුදල් ප්‍රමාණයන් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවීමෙන් මාස තුනක් ඇතුළත හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කල යුතුය. ඒ අනුව තැන්පත් කල යුතු සම්පූර්ණ මුදල වන්නේ තුන්කෝටි තිස් හතර ලක්ෂ හතළිස් පන්දහස් එකසිය තිස් අටක (රු. 33,445,138.00) මුදලකි.

වෙනත් ව්‍යවස්ථාපිත දීමනා හිමිකමක් නැත.

අදාළ සේවක සේවිකාවන්ගේ සේවා කල යුතු කාලය හා වන්දි මුදල් පිළිබඳ උපලේඛනය මේ සමඟ අමුණා ඇත.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ලෝරා සුමතිපාල,
බේරුම්කරු.

**උපලේඛනය**

A/ 56/ 2018

IR/ COM/ 03/2016/ 158

| සේවකයාගේ නම | විශ්‍රාම ගන්වන ලද දිනය | එදිනට මූලික වැටුප | සිය කැමැත්ත මත විශ්‍රාමය හෝ නැවත සේවය | වන්දි මුදල | විශ්‍රාම යාමෙන් පසු පැවරුම් රාජකාරි කාලය | පැවරුම් රාජකාරි මඟින් උපයාගත් මුදල | ගෙවිය යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| ටී. ඩබ්. කේ. චින්තා මිය | 2018.02.26 | රු. 32,580.00 | 2022.06.26 | රු. 1,694,160.00 | - | - | රු. 1,694,160.00 |
| එම්. ඒ. සරත් මයා | 2017.03.27 | රු. 40,000.00 | නැත | රු. 2,400,000.00 | මාස 06 2017.04.01- 2017.09.30 | රු. 240,000.00 | රු. 2,160,000.00 |
| සිසිර නානායක්කාර මයා | 2019.03.15 | රු. 40,354.00 | 2022.06.15 | රු. 1,573,806.00 | - | - | රු. 1,573,806.00 |
| ඕ. එච්. සිරිපාල මයා | 2018.12.24 | රු. 35,043.00 | 2022.06.24 | රු. 1,471,806.00 | - | - | රු. 1,471,806.00 |
| එච්. සුනිල් මයා | 2016.10.16 | රු. 33,525.00 | නැත | රු. 2,011,500.00 | - | - | රු. 2.011,500.00 |
| අයි. කේ. සෝමපාල මයා | 2018.06.21 | රු. 32,994.00 | 2022.06.21 | රු. 1,583,712.00 | - | - | රු. 1,583,712.00 |
| අබේසිංහ මද්දුමපටබැඳිගේ ගාමිණී මයා | 2018.11.07 | රු. 36,206.00 | 2022.06.07 | රු. 1,556,858.00 | - | - | රු. 1,556,858.00 |
| ඊ. ගුණරත්න මයා | 2017.06.18 | රු. 35,627.00 | නැත | රු. 2,137,620.00 | - | - | රු. 2,137,620.00 |
| අජිත් නානායක්කාර මයා | 2018.12.09 | රු. 45,125.00 | 2022.06.09 | රු. 1,895,250.00 | - | - | රු. 1,895,250.00 |
| ඩබ්. ජී. නිමල් මයා | 2018.12.28 | රු. 37,396.00 | 2022.06.28 | රු. 1,570,632.00 | - | - | රු. 1,570,632.00 |
| ජී. එම්. මුනිදාස මයා | 2016.12.01 | රු. 29,435.00 | නැත | රු. 1,766,100.00 | - | - | රු. 1,766,100.00 |
| ආර්. ඒ. ජී. ධර්මසිරි මයා | 2018.12.04 | රු. 32,580.00 | 2022.06.04 | රු. 1,368,360.00 | - | - | රු. 1,368,360.00 |

| සේවකයාගේ නම | විශ්‍රාම ගන්වන ලද දිනය | එදිනට මූලික වැටුප | සිය කැමැත්ත මත විශ්‍රාමය හෝ නැවත සේවය | වන්දි මුදල | විශ්‍රාම යාමෙන් පසු පැවරුම් රාජකාරි කාලය | පැවරුම් රාජකාරි මඟින් උපයාගත් මුදල | ගෙවිය යුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| ඒ. ජී. ධර්මසිරි මයා | 2016.06.28 | රු. 31,265.00 | නැත | රු. 1,875,900.00 | - | - | රු. 1,875,900.00 |
| හේවා කංකානම්ගේ දයාරත්න මයා | 2018.04.29 | රු.36,230.00 | 2022.06.29 | රු. 1,811,500.00 | - | - | රු. 1,811,500.00 |
| ඒ. ප්‍රේමදාස මයා | 2018.10.26 | රු. 29,810.00 | 2022.06.26 | රු. 1,311,640.00 | - | - | රු. 1,311,640.00 |
| වී. රාජේශ්වරී මිය | 2017.09.17 | රු. 31,145.00 | 2022.06.17 | රු. 1,775,265.00 | මාස 03<br>2017.09.19-<br>2017.12.18 | රු. 93,435.00 | රු. 1,681,830.00 |
| ඩබ්ලිව්. ජී. සුතසෝම මයා | 2016.08.29 | රු. 45,000.00 | නැත | රු. 2,700,000.00 | මාස 06<br>2016.09.01-<br>2017.02.28<br><br>මාස 06<br>2017.03.07-<br>2017.09.07 | රු. 540,000.00 | රු. 2,160,000.00 |
| කේ. සිසිල් කුමාරි කුලතුංග මිය | 2018.02.15 | රු. 34,857.00 | 2022.06.15 | රු. 1,812,564.00 | - | - | රු. 1,812,564.00 |
| ඩබ්ලිව්. ජී. ඩයස් මයා | 2016.05.06 | රු. 33,365.00 | නැත | රු. 2,001,900.00 | - | - | රු. 2,001,900.00 |
| වී. ජී. ලීලානන්ද මයා | 2020.09.20 | රු. 36,550.00 | සිය කැමැත්ත මත විශ්‍රාම යාම. | - | - | - | - |
| **එකතුව** | - | - | - | **රු. 34,318,573.00** | - | **(රු. 873,435.00)** | **රු. 33,445,138.00** |

ලෝරා සුමතිපාල,
බේරුම්කරු.

EOG 09- 0157

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.